## පුරාකෘත පිටස්තරයා 1



# සාහිත්‍යයෙන් ගොඩනැගෙන මිනිසාගේ පළමු ආගන්තුකයාගේ පැමිණීම





**ආචාර්ය**
**සුනිල් විජේසිරිවර්ධන**



පිටස්තරයා හෙවත් ආගන්තුකයා පිළිබඳ තේමාව හුදෙක්ම නූතනත්වයේ ගැටළු සමග සම්බන්ධ නූතනවාදී තේමාවක් යැයිද ඇල්බෙයා කැමූ ගේ 1942 පළකරන ලද ප්‍රකට නවකතාවෙන් ප්‍රභවය ලැබී යයි ද නොතන් වැසි නොමේරූ සාහිත්‍ය ලෝලීන් විසින් විශ්වාස කිරීම අරුමයක් නොවේ . සමහර ග්‍රාම්‍ය මාක්ස්වාදීහු පුද්ගලයින් අත්විඳින පිටස්තරබව මාක්ස් විසින් විස්තර කරන ලද ධනේශ්වර ක්‍රමය විසින් ඇතිකරන පරාරෝපණය පිළිබඳ ප්‍රශ්ණයට පමණක් ලඝු කරති . මේ කී තත්ත්වයන් විසින් පිටස්තරබව/ආගන්තුකබව පිළිබඳ අළුත් අත්දකීම් මානව ජීවිතයට එක් කළබවද , අළුත් පිටු මානව ඉතිහාසයට ඇතුල් කළ බවද , නව කතිකාවන් සම්පාදනය කළ බව ද සැබෑය . එහෙත් මගේ අදහස නම් අප මේ හඳුනා ගන්නට /හසු කරගන්නට වෑයම් කරන්නේ චිරන්තනයේ සිට අප හා ගමන් කරන මහා පුරාකෘත චරිතයක දහසක් මුහුණු බවය. පුරාකෘත චරිතය (ීරජයැඑහවැ ) සංකල්පනය කළ කාල් යුංග් මේ චරිතය වෙන්කොට හඳුනා ගත් බවක් නොදනිමි . නමුත් ඬවීරයා ඬ නමින් නම් කෙරුණු පුරාකෘතිය තුළ මුහුණු සියයක් වත් වෙන්විය යුත්තේ ඬආගන්තුකයාටඬ බව තහවුරු කෙරෙන ශාස්ත්‍රීය /සාහිත්‍යාත්මක කරුණු ගොන්නකි .

**<u>Clan of the Cave Bear නම් ආරම්භක නවකථාව අයිලා නම් අනාථ වූ ක්‍රෝ-මැග්නන් දැරියක් නියාන්දර්තල් ගෝත්‍රයක් විසින් රැගෙන හදාවඩාගන්නා පුවතක් දිග හරියි. යොවුන් වියට පැමිණෙන අයිලා "අනෙක් අය" සොයා (අද්‍යතන යුක්‍රයින අඩවියේ සිට අද ප්‍රංශය තිබෙන බටහිර යුරෝපය දක්වා) යන දීර්ඝ චාරිකාව ගැන හද මනස ඇද බැඳ ගන්නා අතිශයින් රසවත් කතන්දර ඉන් පසු එන නවකතාවල අපට කියවන්නට ලැබේ</u>**

මානව සම්භවය සහ පරිණාමය පිළිබඳ මානව විද්‍යාඥයින් ගොඩ නගාගෙන යන කතන්දරය දැන් හොඳටම සංකීර්ණ මාවත්වලට පිවිස තිබේ . එහි එක ජවනිකාවක් නම් වසර 40,000 - 45,000 මානයේ යුරෝපය ට සංක්‍රමණය වූ මුල් නව මානවයා (Cro - Magnon නමින් සාමාන්‍යයෙන් හැඳින්වෙන) හට ඒ වනවිට එහි ජීවත් වෙමින් සිටි නියන්දර්තල් මානවයා හමුවීමේත් , අනතුරුව වසර 5000 - 10000 ක කාල පරිච්ඡේදයක් තුළ මෙකී මානව දෙවර්ගය සමාන්තරව දක්නට ලැබීමේත් කතාන්දරයයි . ඉන්පසු නියාන්දර්තල් ගෝත්‍රිකයෝ මිහි පිටින් අතුරුදන් වෙති .

මේ මානව දෙවර්ගයේ සම්පර්කය - හමුව - මුණ ගැසීම ගැන මෙන්ම නියාන්දර්තල් ගෝත්‍රිකයින් අතුරුදන් වීම ගැනද විද්වතුන් අතර ගැවසෙන ප්‍රවාද රාශියකි. කෙසේ නමුත් එම හමුවේ එක් ප්‍රතිපලයක් වශයෙන් නූතන මිනිසාගේ ප්‍රවේණිය තුළට නියාන්දර්තල් ජාන සමූහයක් එකතුවූ බව අද තහවුරු වූ කරුණකැයි කිව හැකිය. මානව වංශ කතාව ගොඩනගන්නට යන සාහිත්‍ය ව්‍යායාමයකට ඒ (නූතන මානව) හෝ මේ (නියාන්දර්තල් ) පර්යාලෝකයෙන් මිනිසාගේ පළමු ආගන්තුකයා / පිටස්තරයා කරළියට පැමිණීමේ කතන්දරයක් ද ගොඩනගන්නට අවශ්‍ය දත්ත හමුවෙනු ඇත.

සාහිත්‍යය මේ අභියෝගය භාරගෙන කලක් ගෙවී ඇත . ඒ අතර මා දන්නා විශිෂ්ටම ප්‍රයත්නය හිමිවන්නේ ඇමෙරිකානු සාහිත්‍ය ලේඛිකාවක් වන Jean M' Auel හටය. ඇයගේ Earth's Children වූ කලී (1980-2011) වසර 30 ක් මුළුල්ලේ ලියා කාණ්ඩ 06කින් පළකරන ලද දැවැන්ත නවකතාවකි. (ඉන් මුල් කාණ්ඩ 04 කියවන්නට ලැබුණත් අවසාන පොත් දෙක තවම කියවා නැති බව කීම සුදුසුය). ඇය ඉහළ පුරාශිලා යුගයේ යුරෝපය පසුබිම් කොට කතන්දරය ගොඩනගන අතර ඊට මා කලින් කියූ මානව දෙවර්ගයේ සම්පර්කයද අදාළය .

Clan of the Cave Bear නම් ආරම්භක නවකථාව අයිලා නම් අනාථ වූ ක්‍රෝ-මැග්නන් දැරියක් නියාන්දර්තල් ගෝත්‍රයක් විසින් රැගෙන හදාවඩාගන්නා පුවතක් දිග හරියි. යොවුන් වියට පැමිණෙන අයිලා "අනෙක් අය" සොයා (අද්‍යතන යුක්‍රයින අඩවියේ සිට අද ප්‍රංශය තිබෙන බටහිර යුරෝපය දක්වා) යන දීර්ඝ චාරිකාව ගැන හද මනස ඇද බැඳ ගන්නා අතිශයින් රසවත් කතන්දර ඉන් පසු එන නවකතාවල අපට කියවන්නට ලැබේ . Ayla ආරම්භක "ආගන්තුක" යා යි . The Valley of Horses නම් දෙවන නවකතාවේදී ඇයට ජොන්දලාර් නම් අපූරු ආගන්තුකයෙක් මුණ ගැසේ . ලිංගික බැඳීමක් සමග ගමන් සගයන් බවට පත් වන මේ යුවල යුරෝපය හරහා දැනියුබ් ගඟ මිටියාවත දිගේ යද්දී වෙනත් වෙනත් නව මානව ගෝත්‍ර ඔවුන්ට අතරමග හමුවේ. The Mammoth Hunters සහ The Plains of Passage නම් වූ 3 සහ 4 කාණ්ඩ තුළ එම දීර්ඝ සහ අනතුරු බහුල චාරිකාව සහ ඔවුන් මුහුණ දෙන සෑම හමුවක්ම " ආගන්තුකයාගේ කතන්දර" පොකුරක් බවට පත්වෙමින් අපට පිරිනැමේ.



Jean M. Auel

මා හිතන විදිහට ආගන්තුක බවේ එක් මූලික දාර්ශනික මානයක් මෙසේ සූත්‍රගත කළ හැකිය ඃ යමෙක් නිසා ලොව වෙනස් වනවා නම් ඒ ඇගේ /ඔහුගේ ආගන්තුකබවේ /පිටස්තර බවේ ප්‍රමාණයටයි . ඔබ හා (සමාජ - සංස්කෘතික අධ්‍යාත්මික ) පරිසරය අතර ආතතියක් නැත්නම් ඔබ ට විපර්යකාරක ශක්තියක් නැත.

විපර්යකාරකයා සෑම විටම කිසියම් ආකාරයක , කිසියම් එක් ජීවන මානයක් තුළ හෝ , කිසියම් ප්‍රමාණයකට හෝ ආගන්තුකයෙකි . නමුත් අනිත් අතට මෙකී ආතතිය සහ බල තුලන මට්ටම අනුව සමාජය විසින් ආගන්තුකයා විනාශ කර දැමීම හෝ ඇගේ /ඔහුගේ ඬපිටස්තර බවඬ විනාශ කොට සාමාන්‍යයෙකු බවට පත් කිරීම හෝ සමහර විට වඩාත් සුලබ සිදුවීමයි.

Jean M. Auel ගේ අයිලා නම් පුරාතන මනුෂ්‍ය දියණිය වූ කලී මූල ආගන්තුකයෙකි. ඇය සාර්ථක විපර්යකාරකයක වන අතර අවසානයේ සෙලන්දෝනි නම් ගෝත්‍රික ප්‍රජාවක අධ්‍යාත්මික නායිකාව බවට පත්වන්නිය.

Auel හට ඇගේ Earth's Children නවකතා මාලාව කරන කොට යුරෝපා විශ්වවිද්‍යාල 4කින් ගෞරව උපාධි ප්‍රදානය කෙරින. ප්‍රංශ රජයේ සංස්කෘතික අමාත්‍යංශය විසින් , වෙසෙසින්ම Earths Children කතා මාලාවේ අවසාන ග්‍රන්ථය වන (දකුණු ප්‍රංශයේ අද්‍යතන ලැස්කෝ ඇතුළු පුරාශිලා චිත්‍ර සහිත ලෙන් සමුදාය පසුබිම් කරගත් "The Land of Painted Caves" උදෙසා විශේෂ ගෞරව නාමයකින් ඇයට උපහාර දක්වන ලදී.

**මතු සම්බන්ධයි**

පොත පත දෙසට හෙලන විමසුම් ඇස

**"සාහිත්‍ය සම්භාෂණ"**

ඕස්ට්‍රේලියා වාසී ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවන්ගේ නිර්මාණ හඳුන්වා දෙන
ජගත් ජේ එදිරිසිංහ සමග දිනේෂා දිල්රුක්ෂි විජේසූරිය ඉදිරිපත් කරන
"සාහිත්‍ය සම්භාෂණ"

**එස්බීඑස් ගුවන් විදුලියේ සිංහල සේවයෙන්**

සෑම මසකම අවසන් අඟහරුවාදා දහවල් 11 ට FM93.1.

අන්තර්ජාලයෙන් www.sbs.com.au/yourlanguage/sinhalese/